කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2015

2020 පෙබරවාරි - සැප්තැම්බර්

සමාජීය විද්‍යා පීඨය

මනෝවිද්‍යාව

ඉගෙනුම පිළිබඳ මනෝවිද්‍යාත්මක ගැටළු PSYC E - 1025

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

1. "ඉගෙනුම යනු චර්යාවේ ඇතිවන වෙනසකි." ඉගෙනුම පිළිබඳ නිර්වචනයන් ආශ්‍රය කරගෙන ඉහත අදහසේ වලංගුතාවය විමසන්න.

2. <u>එක්කෝ</u>
"නිරීක්ෂණය කළ හැකි චර්යාව" අධ්‍යයනයෙහි ලා ඊ. එල්. තෝන්ඩයික් විසින් ඉදිරිපත් කරන ලද ඉගෙනුම් සංකල්පයන්හි වැදගත්කම සමාලෝචනය කරන්න.

   <u>නැතිනම්</u>
උත්තේජය හා ප්‍රතිචාරය අතර සබඳතාවයේ ප්‍රතිඵලයක් ලෙස ඉගෙනුමක් සිදුවන ආකාරය උදාහරණ සහිතව ගෙනහැර දක්වන්න.

3. "ප්‍රතිචාරයක් නැවත ඇතිවීමේ සම්භාවිතාව එහි ප්‍රතිඵල මත තීරණය වේ." ප්‍රකාරක ආරෝපණයට අනුව මෙම අදහස විශ්ලේෂණය කරන්න.

4. නිරීක්ෂණාත්මක ඉගෙනුම ( Observational Learning ) සිදුවන ආකාරය හා ඊට අදාළ සංකල්ප උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

5. ඉගෙනුම පිළිබඳ ගෙස්ටෝල්ට් මනෝවිද්‍යාඥයින්ගේ අදහස්වල වටිනාකම අගයන්න.

6. ඉගෙනුමට බලපාන මනෝවිද්‍යාත්මක සාධක සාකච්ඡාවට ලක්කරන්න.

7. ඉගෙනුම හා මතකය අතර සබඳතාව පැහැදිලි කර මතකයේ කොටස් විස්තර කරන්න.

8. විවිධ ඉගෙනුම් කුසලතා ප්‍රායෝගිකව භාවිත කළ හැකි ආකාරය පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

**************************